# අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) - 2024
# කතෝලික ධර්මය

**I වන පත්‍රය**

**සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. ශුද්ධ බයිබලය බෙදිය හැකි ප්‍රධාන කොටස් ගණන,
   (1) 2 කි. (2) 3 කි. (3) 4 කි. (4) 5 කි.

2. බොරු ගුරුවරුන්ගේ වැරදි ඉගැන්වීම් නිවැරදි කිරීමේ අරමුණින් ලිපියක් ලියන ලද්දේ කා හට ද?.
   (1) ගලාතිවරුන්ට. (2) කොරින්තිවරුන්ට.
   (3) තෙසලෝනිකවරුන්ට. (4) කොලොස්සිවරුන්ට.

3. නව ගිවිසුමට අයත් හසුන්පත් සංඛ්‍යාව,
   (1) 20 කි. (2) 21 කි. (3) 23 කි. (4) 24 කි.

4. ඩොමිෂියන් නම් වූ රෝම අධිරාජ්‍යයා යටතේ වූ දරුණු පීඩන සමයක කිතුනුවන් ධෛර්යමත් කිරීම පිණිස හා විශ්වාසයේ ස්ථිර පැවැත්ම සඳහා ලියන ලද ග්‍රන්ථයකි,
   (1) හිතෝපදේශ ය. (2) ධර්මදේශකයා. (3) එළිදරව්ව. (4) උපදේශකයා.

5. යහපත හා අයහපත හඳුනාගෙන, යහපත තම තුළ ක්‍රියාත්මක කරමින් දෙවියන් වහන්සේට ප්‍රසන්න දැහැමි ජීවිතයක් ගත කිරීම,
   (1) ප්‍රඥාවයි. (2) දැනගැන්මයි. (3) දැනමුතුකමයි. (4) දේව භයයි.

6. ''මෙතැන් පටන් මනුෂ්‍ය පුත්‍රයාණන් දෙවියන් වහන්සේගේ බලපරාක්‍රමයෙන් දකුණු පස වැඩ හිඳිනු ඇත''යනුවෙන් ජේසුස් වහන්සේ ප්‍රකාශ කළේ කවුරුන් ඉදිරියෙහි ද?.
   (1) හෙරෝද් ඇන්ටිපස්. (2) රෝම අධිරාජ්‍යයා.
   (3) පිලාත් ආණ්ඩුකාරයා. (4) ජුදා ශ්‍රේෂ්ඨාධිකරණ සාමාජිකයින්.

7. ''ඔබ පොළොවෙහි යමක් බඳින්නෙහි ද එය ස්වර්ගයෙහි දීත් බඳිනු ලබන්නේ ය'' මෙසේ පැවසූයේ,
   (1) ශුද්ධ වූ ජොහන් තුමාට ය. (2) ශුද්ධ වූ පාවුලු තුමාට ය.
   (3) ශුද්ධ වූ පේදුරු තුමාට ය. (4) ශුද්ධ වූ ජාකොබ් තුමාට ය.

8. ශුද්ධ වූ සභාවේ ඒකත්වය යනුවෙන් අදහස් කරන්නේ,
   (1) අපෝස්තලිකත්වයයි. (2) ශුද්ධත්වයයි. (3) කතෝලිකත්වයයි. (4) එකමුතුකමයි.

9. ක්‍රිස්තුන් වහන්සේ සදාතනික භෝජනය වන දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ස්ථාපිත කළේ,
   (1) මහ බ්‍රහස්පතින්දා ය. (2) මහ සිකුරාදා ය.
   (3) ආලේලූයියා සෙනසුරාදා ය. (4) පාස්කු ඉරිදා ය.

10. පුරාණ ගිවිසුමේ වන්දනාවේ කේන්ද්‍රීය ක්‍රියාව වූයේ,
    (1) සිනගෝගයට යාමයි. (2) අසල්වැසියාට ප්‍රේම කිරීමයි.
    (3) යාග පූජා පුද කිරීමයි. (4) ජෙරුසලෙම් දේව මාළිගාව ඉදිකිරීම යි.

11. ශුද්ධ වූ මැක්ෂිමිලියන් කෝල්බේ මුනිතුමාට දේව මාතාවන් දර්ශනය වන විට එතුමියගේ අතේ තිබුණේ කුමක් ද?.
    (1) ශ්‍රී කුරුසියක් සහ ජපමාලයක්. (2) සුදු රෝස ඔටුන්නක් සහ ශ්‍රී කුරුසියක්
    (3) රතු රෝස ඔටුන්නක් සහ ශ්‍රී කුරුසියක් (4) සුදු රෝස ඔටුන්නක් සහ රතු රෝස ඔටුන්නක්.

12. ''මා හැර අන් කිසි දෙවි කෙනෙකු නුඹට නොසිටිය යුතු ය.'' මෙම ප්‍රකාශය ඇතුළත් වන්නේ දස පනතේ කුමන පනතට ද?.

(1) පළමු පනතට (2) දෙවන පනතට (3) තුන්වන පනතට (4) සතරවන පනතට

13. ආදි පිතෘ ජාකොබ්ගේ පුත් ජෝසෙප් වරදට පොළඹවා ගැනීමට උත්සාහ කළේ කවරෙකුගේ බිරිඳ විසින් ද?.

(1) ඉෂ්මායෙල්ගේ (2) පොතිපර්ගේ (3) ඒසව්ගේ (4) රූබන්ගේ

14. තමන් ඉගෙන ගන්නා පාසලේ නීතිරීති කඩ කිරීම විරුද්ධ ක්‍රියාවක් වන්නේ,

(1) තුන්වන පනතට ය. (2) සිව්වන පනතට ය.
(3) පස්වන පනතට ය. (4) හයවන පනතට ය.

15. හත්වන දේව පනතට විරුද්ධ ව කරනු ලබන ක්‍රියාවකි,

(1) සිය දිවි නසා ගැනීම. (2) පොරොන්දු කඩ කිරීම.
(3) පුද්ගල වැරදි ප්‍රසිද්ධියේ පැවසීම. (4) අන් අයගේ දේපළ පැහැර ගැනීම.

16. ''ස්වාමීන්ගේ ආත්මයාණන් පරික්ෂා කරන්නට ඔබ දෙපොළ එකඟ වූයේ කෙසේ ද? අන්න ඔබේ පුරුෂයා ගෙන ගොස් වැළලූ අය දොර ළඟ සිටිති.'' ශුද්ධ වූ පේදුරු තුමා මෙසේ පැවසුවේ,

(1) සපීරාට ය. (2) මාර්තාට ය. (3) ප්‍රිස්කිලාට ය. (4) ලිදියාට ය.

17. ජන වන්දනා වසරේ (දේව වන්දනා වසරේ) ජනවාරි මාසයේ දී සිදු කරනු ලබන මංගල්‍යයක් වනුයේ,

(1) ශුද්ධ වූ ජුසේ මුනිතුමාගේ මංගල්‍යයයි.
(2) සුවිශේෂක ශුද්ධ වූ මාක් තුමාගේ මංගල්‍යයයි.
(3) ජේසුස් වහන්සේ අන්‍ය රූප විලාශවීමේ මංගල්‍යයයි.
(4) රජුන්ට ප්‍රත්‍යක්ෂ වීමේ මංගල්‍යයයි.

18. දිව්‍ය පූජාව වේලාවේ දී ආසිරි පැන් ඉසිනු ලැබීම,

(1) ස්තෝත්‍ර යාගික පිළිවෙතකි. (2) පශ්චාත්තාපික පිළිවෙතකි.
(3) දේව වාක්‍යය පිළිවෙතට සූදානමකි. (4) පුදසුන සූදානම් කිරීමේ පිළිවෙතකි.

19. හිස් තැනට සුදුසු පිළිතුර තෝරන්න.

ශුද්ධ වූ ජොහන් තුමාගේ සුවිශේෂයට අනුව එක ම සැබෑ දෙවියන් වන පියාණන් වහන්සේව ද එතුමන් විසින් එවන ලද ජේසුස් වහන්සේව ද දැන ගැන්ම……………….. වේ.

(1) දේව ඇදහිල්ල (2) ප්‍රේම පාරමිතාව
(3) සදාතන ජීවනය (4) අභිවෘද්ධි ආලේපය

20. ජේසුස් වහන්සේ මල් උයනේ දී (ගෙත්සෙමනෙ) තම ශ්‍රාවකයන්ට කොපමණ වාරයක් යාච්ඤා කරන ලෙස උපදෙස් දුන්නා ද?.

(1) දෙවරක් (2) තෙවරක් (3) සිව්වරක් (4) පස්වරක්

21. සම්මත සහ ද්විතීය සම්මත ග්‍රන්ථ වෙන් වෙන් වශයෙන් දක්වා **නැත්තේ,**

(1) ලතින් පිටපත තුළ ය. (2) ග්‍රීක පිටපත තුළ ය.
(3) මැසොරෙටික් පිටපත තුළ ය. (4) හෙබ්‍රෙව් පිටපත තුළ ය.

22. දේශක දිවැසිවරු පමණක් අඩංගු වරණය තෝරන්න.

(1) එලීෂා, අභියා, මීකා, ජෝනා (2) නාතාන්, එළියා, මීකා, ජෝබ්
(3) එලියා, හුල්දා, මීකායා, අභියා (4) හුල්දා, මිකායා, ජෝබ්, නාතාන්

23. ''නුඹ මෙතරම් කිපී දුර්මුඛ වී සිටින්නේ මන් ද?. මෙසේ පවසන ලද්දේ කා විසින් කා හට ද?.

(1) දෙවියන් වහන්සේ විසින් කායින්ට (2) දෙවියන් වහන්සේ විසින් ආදම්ට
(3) ස්නාවක ජොහන් විසින් හෙරොදියස්ට (4) ක්‍රිස්තුන් වහන්සේ විසින් පර්සිවරුන්ට

24. හිස් තැනට සුදුසු වචනය තෝරන්න.
ආබ්‍රහම් තුමාගේ පෙළපත මිසරයෙහි දී වර්ධනය වූයේ ……………….. මත ය.
(1) පාරාවෝ රජුගේ (2) ඉශ්‍රායෙල්වරුන්ගේ (3) ජෝසෙප්ගේ (4) මිසර රජවරුන්ගේ

25. වසංගත 4, 6 සහ 8 නිවැරදි අනුපිළිවෙලින් සඳහන් වරණය තෝරන්න.
(1) මැඩි උවදුර, මැසි උවදුර සහ පළගැටි උවදුර
(2) කිනිතුළු උවදුර, මැසි උවදුර සහ ගඩු උවදුර
(3) මැසි උවදුර, ගඩු උවදුර සහ පළගැටි උවදුර
(4) මැඩි උවදුර, ගල් වර්ෂා උවදුර සහ පළගැටි උවදුර

26. ''නුඹ රැකගත යුතු මාගේ ගිවිසුම නම් මේ ය. එනම්, නුඹලාගේ පිරිමි දරුවන් චර්මඡේදනය කළ යුතු ය.'' මෙසේ සඳහන් වන්නේ,
(1) උත්පත්ති පොතෙහි ය. (2) නික්මයාම පොතෙහි ය.
(3) ගණන් කථාවෙහි ය. (4) ද්විතීය නීති සංග්‍රහයෙහි ය.

27. ''දෙවියන් වහන්සේ ආබ්‍රහම් සමග ඇති කරගත් ගිවිසුම ඉදිරිපත් කර ඇති සම්ප්‍රදායන් **දෙක** වන්නේ,
(1) යාවේ සම්ප්‍රදාය සහ එලොහිම් සම්ප්‍රදායයි.
(2) ද්විතීය නීති සම්ප්‍රදාය සහ පූජක සම්ප්‍රදායයි.
(3) යාවේ සම්ප්‍රදාය සහ පූජක සම්ප්‍රදායයි.
(4) යාවේ සම්ප්‍රදාය සහ ද්විතීය නීති සම්ප්‍රදායයි.

28. නව සමාජ ධර්මය තුළ යුක්තිය, සාධාරණත්වය, සාමූහිකත්වය, සහජීවනය, ප්‍රේමය සහ දයාව ගැබ්ව ඇති බව ඉදිරිපත් කරන ලද්දේ,
(1) මෝසස් තුමා ය. (2) ක්‍රිස්තුන් වහන්සේ ය. (3) ස්නාවක ජොහන් තුමා ය. (4) ආබ්‍රහම් තුමා ය.

29. ''දියණියනි, ධෛර්ය ගන්න, ඔබේ ඇදහිල්ල ඔබ සුවපත් කළේ ය.''ජේසුස් වහන්සේ මෙසේ පැවසවේ කාහට ද? .
(1) මද්ගලාහි මරියාට (2) සමාරිය ස්ත්‍රියට
(3) නායක පූජකයාගේ දියණියට (4) සළුවට අත ගැසූ ස්ත්‍රියට

30. පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරන්න.
A – ප්‍රසාද ස්නාපනයේ ප්‍රධාන හා අනිවාර්ය සංකේතයයි.
B – උත්ථාන වූ ක්‍රිස්තුන් වහන්සේගේ සළකුණයි.
C – කිතුනුවකු සේ ශක්තිමත් කරනු ලබයි.
D – පිරිසිදුකමේ සළකුණයි.
ඉන් එක් එක් කරුණෙන් අදහස් වන්නේ ප්‍රසාද ස්නාපනයේ දී භාවිත වන ද්‍රව්‍යවල අර්ථයයි. එම ද්‍රව්‍ය අනුපිළිවෙලින් සඳහන් වරණය තෝරන්න.
(1) ක්‍රිස්මා තෛලය, පාස්කු ඉටිපහන, ජලය සහ සුදු වස්ත්‍රය.
(2) පාස්කු ඉටිපහන, ක්‍රිස්මා තෛලය, සුදු වස්ත්‍රය සහ ජලය.
(3) ක්‍රිස්මා තෛලය, ජලය, පාස්කු ඉටිපහන සහ සුදු වස්ත්‍රය.
(4) ජලය, පාස්කු ඉටිපහන, ක්‍රිස්මා තෛලය සහ සුදු වස්ත්‍රය.

31. හිස්තැනට සුදුසු පිළිතුර තෝරන්න.
පූජකවරයේ පූර්ණත්වය හිමිවන්නේ ……………….. ධූරයට ය.
(1) රාජගුරුප්‍රසාදි (2) තාපස (3) තේවාචාරි (4) පැවිදි

32. විවාහ නොවී තම මුළු ජීවිතය ම දේව රාජ්‍යය උදෙසා කැප කිරීම හඳුන්වනු ලබන්නේ,
(1) සේවයේ ජීවිතය යනුවෙනි.
(2) පූජක බඹසර යනුවෙනි.
(3) සාංඝික ජීවිතය යනුවෙනි.
(4) පරාර්ථකාමිත්වයේ ජීවිතය යනුවෙනි.

33. තාපස ජීවිතයට විනය මාලාවක් සකස් කළ, තාපස දිවියේ පුරෝගාමීන් ලෙස සළකනු ලබන්නේ,
(1) ශුද්ධ වූ ජොහන් තුමා සහ අගොස්තීනු තුමා ය.
(2) ශුද්ධ වූ බෙනඩික්ට් තුමා සහ ශුද්ධ වූ බැසිල් තුමා ය.
(3) ශුද්ධ වූ ජෙරොම් තුමා සහ ශුද්ධ වූ ජොහන් තුමා ය.
(4) ශුද්ධ වූ බෙනඩික්ට් තුමා සහ ශුද්ධ වූ ජාකෝමියස් තුමා ය.

34. කිතුනුවාට පොදු පූජකවරය තුළින් ලැබෙන දිවැසිවර කාර්යයෙහි නිරත වීමට තෝතැන්නක් වන්නේ,
(1) මරිය හමුදාව යි. (2) දහම් පාසල යි.
(3) දිව්‍ය හෘදය සමිතිය යි. (4) තරුණ කතෝලික ශිෂ්‍ය ව්‍යාපාරය යි.

35. ෆ්‍රැන්ක් ඩෆ් මහතා විසින්, ආරම්භ කරන ලද ගිහි අපෝස්තලික සේවාව වන්නේ,
(1) තරුණ කතෝලික ශිෂ්‍ය ව්‍යාපාරය යි.
(2) දිව්‍ය හෘදය සමිතිය යි.
(3) මරිය හමුදාව යි.
(4) සාන්ත වින්සන් ද පාවුලා සමිතිය යි.

36. දෙවි-මිනිස් සංවාදය සඳහා කිතු සමිඳුන් අපට ලබා දුන් පූර්වාදර්ශය වන්නේ,
(1) පාළුකරයේ යාච්ඤාව යි. (2) මල් උයනේ යාච්ඤාව යි.
(3) උත්තම පූජක යාච්ඤාව යි. (4) ස්වාමිවාක් ආරාධනාව යි.

37. කතෝලික සභා ධර්මෝපදේශයට අනුව අපගේ වන්දනාව හිමිවිය යුත්තේ,
(1) පියාණන් වහන්සේට, පුත්‍රයාණන් වහන්සේට සහ මරිය තුමියට පමණි.
(2) පියාණන් වහන්සේට, පුත්‍රයාණන් වහන්සේට සහ ශුද්ධාත්මයාණන් වහන්සේට පමණි.
(3) පියාණන් වහන්සේට, මරිය තුමියට සහ ශුද්ධාත්මයාණන් වහන්සේට පමණි.
(4) පුත්‍රයාණන් වහන්සේට, මරිය තුමියට සහ ශුද්ධාත්මයාණන් වහන්සේට පමණි.

38. ක්‍රි.ව. 1917 පාතිමා නුවර දී මරිය මාතාවන් වහන්සේ දර්ශනය වූයේ කා හට ද?
(1) ප්‍රැන්සිස්කෝ, ජසින්තා හා ලුසීට
(2) ප්‍රැන්සිස්කෝ, බර්නදෙත් හා ජසින්තාට
(3) ජසින්තා, ලුසී හා ගොරෙත්තිට
(4) ලුසී, ෆෙලිසිටා හා ජසින්තාට

39. යාම යැදුම තුළින් යාමයෙන් යාමයට දෙවියන් වහන්සේට ප්‍රශංසා කරන්නේ,
(1) එය අපට අවශ්‍ය සියලු දේ ලබා ගැනීමේ යැදුමක් වන නිසා ය.
(2) එහි දාවිත් රජතුමාගේ ගීත ඇතුළත් වන නිසා ය.
(3) කාලය දෙවියන් වහන්සේට අයිති නිසා ය.
(4) එය පැරණි ඉශ්රායෙල්වරුන්ගේ සිරිතක් ව පැවති නිසා ය.

40. කතෝලික අපගේ භාවනාව සඳහා මූලාශ්‍රය වන්නේ,
(1) දේව වචනය ගැබ් ව ඇති ශුද්ධ ලියැවිල්ල ය.
(2) මහෝපදේශය ය.
(3) සුළු උපදේශය ය.
(4) කතෝලික සභා ධර්මෝපදේශය ය.

## II වන පත්‍රය

**කෙටි පිළිතුරු ලියන්න**

1. (i) ශුද්ධ වූ පාවුලු තුමා විසින් යවන ලද ලිපි මගින් ඉටුකරන ලද සේවාවන් **දෙකක්** ලියා දක්වන්න.
   (ii) ශුද්ධ වූ ජුසේ වාස් මුනිතුමාගේ දෙමාපියන්ගේ නම් ලියන්න.
   (iii) හතරවන පනතට අනුව ප්‍රේමයෙන් දිවි ගෙවීම සඳහා පවුලෙන් පිටත අය වෙනුවෙන් කළ හැකි දෑ **දෙකක්** දක්වන්න.
   (iv) ඔබගේ ජීවිතය දෙවියන් වහන්සේට පිදෙන යාගයක් බවට පත්කර ගන්නා ආකාරය කෙසේ ද යන්න පෙන්වා දීමට උදාහරණ **දෙකක්** දක්වන්න.
   (v) මයඞාදාව හා සම්බන්ධ දේව පනත් **දෙක** ලියා දක්වන්න.
   (vi) ශුද්ධ බයිබලය තුළ ඇති ගිවිසුම් සාමාන්‍ය සමාජයේ ඇති ගිවිසුම්වලට වඩා වෙනස් ය. එවැනි වෙනස්කම් **දෙකක්** ලියන්න.
   (vii) ස්නාවක ජොහන් තුමා සෙබළුන්ට දුන් අවවාද **දෙකක්** ලියන්න.
   (viii) ''දෙවියන් වහන්සේ ව දකින'' හා ''දෙවියන් වහන්සේගේ පුත්‍රයෝ යැයි කියනු ලබන'' යන පද ඇතුළත් භාග්‍ය **දෙක** සම්පූර්ණයෙන් ලියා දක්වන්න.
   (ix) ආශිර්වාදකාර බන්ධනයේ විවාහ පොරොන්දු තුළ ඇති පොරොන්දු **දෙකක්** ලියන්න.
   (x) මරිය තුමිය හා සම්බන්ධ මංගල්‍යය අතුරින් ණය මංගල්‍යය **දෙකක්** ලියා දක්වන්න.
2. (i) ජේසුස් වහන්සේගේ ස්වර්ගාරෝහණයෙන් පසු ශුද්ධාත්මයාණන් බලාපොරොත්තුවෙන් සිටි මරිය තුමිය ඇතුළු ශ්‍රාවක පිරිස ශුද්ධාත්ම දිනයේ දී අත්දුටු සිද්ධීන් **දෙකක්** ලියා දක්වන්න.
   (ii) මුල් කිතුනු සභාවේ උපස්ථායකයින් පත්කිරීමේ දී සළකා බැලූ කරුණු **තුන** ලියා දක්වන්න.
   (iii) ඔබේ ජීවිතයේ දී ශුද්ධාත්ම වරම් අත්දුටු අවස්ථා **පහක්** කෙටියෙන් විස්තර කරන්න.
3. (i) ධර්මදූත චාරිකාවල දී ශු.පාවුලු තුමා මුහුණ දුන් බාධා **දෙකක්** නම් කරන්න.
   (ii) ශු.පාවුලු තුමාගේ දෙවන ධර්මදූත ගමනේ විවිධ අවස්ථාවල දී එතුමා සමඟ සම්බන්ධ වූ **තිදෙනා** නම් කරන්න.
   (iii) සිසුවකු වශයෙන් ඔබේ පාසල තුළ දෙවියන් වහන්සේ සඳහා ඔබට කළ හැකි දෑ **පහක්** කෙටියෙන් විස්තර කරන්න.
4. (i) ''කතෝලික සභා ධර්මෝපදේශය'' අනුව අපගේ ජීවිත කෙරෙහි ඇති වගකීම් **දෙකක්** ලියන්න.
   (ii) දෙවියන් වහන්සේ, මනුෂ්‍යයා විසින් පාලනය කරනු ලැබීම සඳහා ඔහු යටතට පත්කළ සතුන් වර්ග **තුනක්** නම් කරන්න.
   (iii) අන් අයගේ ජීවිත සුරැකීමට ඔබ කටයුතු කරන ආකාරය කරුණු **පහකින්** විස්තර කරන්න.
5. (i) පංච පුස්තකයෙහි සඳහන් පූජක සම්ප්‍රදායට අයත් සිද්ධි **දෙකක්** ලියන්න.
   (ii) පංච පුස්තකයේ ඇති වැදගත්කම කරුණු **තුනකින්** ඉදිරිපත් කරන්න.
   (iii) දේව වචනය ඔබේ ජීවිතයට ආලෝකයක් කරගන්නා ආකාරය කරුණු **පහකින්** පැහැදිළි කරන්න.
6. (i) ප්‍රසාද ස්නාපනය දානය කිරීමේ දී 'ක්‍රිසම්'(Chrism) තෛලය ආලේප කිරීම මගින් කිතුනුවකු ශක්තිමත් කරනු ලබන්නේ කුමක් සඳහා දැයි කරුණු **දෙකකින්** ලියා දක්වන්න.
   (ii) ප්‍රසාද ස්නාපනයෙන් ලැබෙන දේව වරප්‍රසාද **තුනක්** සඳහන් කරන්න.
   (iii) ප්‍රසාද ස්නාපනය තුළින් ඔබ ලැබූ ත්‍රිවිධ කාර්යයන් ක්‍රියාවට නංවන ආකාර **පහක්** පැදැදිළි කරන්න.
7. පහත සඳහන් මාතෘකාවලින් **දෙකක්** තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.
   (i) දිව්‍ය සත්ප්‍රසාදයීය ලක්ෂණක් වන 'පරිස්මරණය'
   (ii) ගරු මයිකල් රොද්‍රිගෝ පියතුමා
   (iii) ඉශ්රායෙල් දිවැසිවරු
   (iv) කතෝලික අපගේ දහම් පාසල

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2024
## කතෝලික ධර්මය I
## පිළිතුරු

| | | | |
|---|---|---|---|
| 1 - 01 | 11 - 04 | 21 - 02 | 31 - 01 |
| 2 - 04 | 12 - 01 | 22 - 03 | 32 - 02 |
| 3 - 02 | 13 - 02 | 23 - 01 | 33 - 04 |
| 4 - 03 | 14 - 02 | 24 - 04 | 34 - 02 |
| 5 - 01 | 15 - 04 | 25 - 03 | 35 - 03 |
| 6 - 04 | 16 - 01 | 26 - 01 | 36 - 04 |
| 7 - 03 | 17 - 04 | 27 - 03 | 37 - 02 |
| 8 - 04 | 18 - 02 | 28 - 03 | 38 - 01 |
| 9 - 01 | 19 - 03 | 29 - 04 | 39 - 03 |
| 10 - 03 | 20 - 02 | 30 - 04 | 40 - 01 |

## කතෝලික ධර්මය - II

**කෙටි පිළිතුරු ලියන්න**

1. (i) ශුද්ධ වූ පාවුලු තුමා විසින් යවන ලද ලිපි මගින් ඉටුකරන ලද සේවාවන් **දෙකක්** ලියා දක්වන්න.

- කිතුනු සංඝවල ගැටළු නිරාකරණය කිරීම.
- අවවාද අනුසාශනා කිරීම.
- විශ්වාසය ස්ථිර කිරීම.
- බොරු ගුරුවරුන්ගේ වැරදි ඉගැන්වීම් නිවැරදි කිරීම.

(ii) ශුද්ධ වූ ජුසේ වාස් මුනිතුමාගේ දෙමාපියන්ගේ නම් ලියන්න.

- ක්‍රිස්ටෝපර් වාස් සහ මරිය මිරැන්ඩා

(iii) හතරවන පනතට අනුව ප්‍රේමයෙන් දිවි ගෙවීම සඳහා පවුලෙන් පිටත අය වෙනුවෙන් කළ හැකි දෑ **දෙකක්** දක්වන්න.

- අන් අය වෙනුවෙන් ගැඹුරින් කැපවීම.
- අන් අය වෙනුවෙන් අඛන්ඩ ව කැපවීම.
- අන් අය වෙනුවෙන් ගැඹුරින් වැයවීම.
- අන් අය වෙනුවෙන් අඛන්ඩ ව වැයවීම.
- අන් අය සමඟ සතුටින්, සමගියෙන් දිවි ගෙවීම.
- පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.
- තම සේවය අවශ්‍ය සැමට ම සේවය කිරීම.
- සේවය ලබන පුරවැසියන්ට සාධාරණය ඉටුකිරීම සහ කාරුණික වීම.
- තම වැටුපට වහල් නොවී සේවය අවංක ව කිරීම.
- පාලකයින් වෙනුවෙන් යාච්ඤා කිරීම.

(iv) ඔබගේ ජීවිතය දෙවියන් වහන්සේට පිදෙන යාගයක් බවට පත්කර ගන්නා ආකාරය කෙසේ ද යන්න පෙන්වා දීමට උදාහරණ **දෙකක්** දක්වන්න.

- එදිනෙදා වැඩකටයුතු හා සතුටු සිනා දෙවියන් වහන්සේට පඬුරක් බවට පත් කර ගැනීම.
- එදිනෙදා දුක් වේදනා දෙවියන් වහන්සේට පඬුරක් බවට පත් කර ගැනීම.

(v) මයඹාදාව හා සම්බන්ධ දේව පනත් **දෙක** ලියා දක්වන්න.

- 6 පනත : කාම මිථ්‍යාචාරය නොකරව.
- 9 පනත : පරදාර ආලය නොකරව.

(vi) ශුද්ධ බයිබලය තුළ ඇති ගිවිසුම් සාමාන්‍ය සමාජයේ ඇති ගිවිසුම්වලට වඩා වෙනස් ය. එවැනි වෙනස්කම් **දෙකක්** ලියන්න.

- ගිවිසුමට මුල පුරන්නේ දෙවියන් වහන්සේ ය.
- දෙවියන් වහන්සේ හා මිනිසා අතර අසීමිත පරතරයක් ඇත .
- දෙවියන් වහන්සේ එම ගිවිසුම් පොරොන්දුවලට පක්ෂපාත වුව ද මිනිසා එම පොරොන්දු බොහෝ විට කඩ කරයි.

(vii) ස්නාවක ජොහන් තුමා සෙබළුන්ට දුන් අවවාද **දෙකක්** ලියන්න.

- කිසිවෙකුගෙන් බලහත්කාරයෙන් වත්, බොරු චෝදනා නැගීමෙන් වත් කිසිවක් පැහැර නොගන්න.
- ඔබට ලැබෙන වැටුපෙන් සෑහී සිටින්න.

(viii) ''දෙවියන් වහන්සේ ව දකින'' හා දෙවියන් වහන්සේගේ පුත්‍රයෝ යැයි කියනු ලබන'' යන පද ඇතුළත් භාග්‍ය **දෙක** සම්පූර්ණයෙන් ලියා දක්වන්න.

- නිර්මල සිත් ඇත්තෝ භාග්‍යවන්තයෝ ය. ඔවුහු දෙවියන් වහන්සේ දකින්නෝ ය.
- සාමය ඇති කරන්නෝ භාග්‍යවන්තයෝ ය. ඔවුහු දෙවියන් වහන්සේගේ පුත්‍රයෝ ය'යි කියනු ලබන්නෝ ය.

(ix) ආශිර්වාදකාර බන්ධනයේ විවාහ පොරොන්දු තුළ ඇති පොරොන්දු **දෙකක්** ලියන්න.

- ඔබට විශ්වාසවන්ත වන්නට මම පොරොන්දු වෙමි.
- ඔබට ප්‍රේම කරමි.
- ඔබට ගෞරව කරමි.

(x) මරිය තුමිය හා සම්බන්ධ මංගල්‍යය අතුරින් ණය මංගල්‍යය **දෙකක්** ලියා දක්වන්න.

- පරිශුද්ධ දේවමාතාවන්ගේ මංගල්‍යය - ජනවාරි 01
- දෙව් මව් ස්වර්ගාරෝපණය වීමේ මංගල්‍යය - අගෝස්තු 15
- දේව මෑණියන්ගේ නිර්මල පිළිසිඳීමේ මංගල්‍යය - දෙසැම්බර් 08

2. (i) ජේසුස් වහන්සේගේ ස්වර්ගාරෝහණයෙන් පසු ශුද්ධාත්මයාණන් බලාපොරොත්තුවෙන් සිටි මරිය තුමිය ඇතුළු ශ්‍රාවක පිරිස ශුද්ධාත්ම දිනයේ දී අත්දුටු සිද්ධීන් **දෙකක්** ලියා දක්වන්න.

- සැඩ සුළඟක් හමන්නාක් මෙන් පැමිණි ශබ්දය.
- ගිනි දළු වැනි දිව් බෙදී ගොස් ඔවුන් එකිනෙකා මත පිහිටීම.
- ආත්මයාණන් ඔවුන්ට දුන් කථා ශක්තිය අනුව අන්‍ය භාෂාවලින් කතා කිරීම.
- ප්‍රබල ව ශ්‍රාවකයින්ගේ ජීවිත වෙනස් වීම.
- දේව වචනයේ සාක්ෂිකරුවන් වීම.

(ii) මුල් කිතුනු සභාවේ උපස්ථායකයින් පත්කිරීමේ දී සළකා බැලූ කරුණු **තුන** ලියා දක්වන්න.

- යහපත් දිවි පෙවතක් ගත කිරීම.
- ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ වීම.
- ප්‍රඥාවෙන් පූර්ණ වීම.

(iii) ඔබේ ජීවිතයේ දී ශුද්ධාත්ම වරම් අත්දුටු අවස්ථා **පහක්** කෙටියෙන් විස්තර කරන්න.

- පන්තියේ සිසුන් අතර වූ ගැටුමක දී නොසිතූ ලෙසට ප්‍රශ්නය නිරාකරණය වීම.
- පාඩමක් නොතේරෙන තත්ත්වයක සිටිය දී මා හට වෙනත් සිසුවකු මගින් එය තේරුම් ගැනීමට හැකිවීම.
- පවුලේ ආර්ථික ගැටළුවක දී යාච්ඤාව තුළ පිළිතුරක් ලැබීම.
- අසනීපයේ දී සුවය පතා යාච්ඤා කළ විට සුවය ලැබීම.
- ඇදහිල්ලේ ජීවිතය සම්බන්ධ ගැටළුවක දී ශුද්ධාත්ම මඟ පෙන්වීම තුළ පිළිතුරු ලැබීම.
- තම කැඳවීම හඳුනා ගැනීමට හැකි වීම.

(මෙවැනි කරුණු **පහක්** කෙටියෙන් විස්තර කරන්න.)

3. (i) ධර්මදූත චාරිකාවල දී ශුද්ධ වූ පාවුලු තුමා මුහුණ දුන් බාධා **දෙකක්** නම් කරන්න.

- සිර කරනු ලැබීම.
- ගල් ගසා නගරයෙන් පිටතට ඇද දමනු ලැබීම.
- ජුදයින්ගේ විරෝධයට ලක් වීම.

(ii) ශු.පාවුලු තුමාගේ දෙවන ධර්මදූත ගමනේ විවිධ අවස්ථාවල දී එතුමා සමඟ සම්බන්ධ වූ **තිදෙනා** නම් කරන්න.

- සීලස්, තිමෝතියස්, ලූක්

(iii) සිසුවකු වශයෙන් ඔබේ පාසල තුළ දෙවියන් වහන්සේ සඳහා ඔබට කළ හැකි දෑ **පහක්** කෙටියෙන් විස්තර කරන්න.

- පන්ති ආරම්භ කිරීමට පෙර යාච්ඤා කිරීම.
- ශුද්ධ ලියවිලි පාඨ පන්ති කාමරයේ ප්‍රදර්ශනය කිරීම.
- පාසල ආරම්භ කිරීමට පෙර මිතුරන් හා එක්ව සුළු මොහොතක් යාච්ඤා කිරීම.
- ජීවිතාදර්ශය.
- සැම දෙන එක සමාන ව සැළකීම.
- නීති ගරුක වීම හා පිදිය යුත්තන් පිදීම.
- දුගී දරුවන්ට උදව් කිරීම.
- පාසලේ සමිති සමාගම්වල නායකත්වය ගැනීම.

(මෙවැනි කරුණු **පහක්** කෙටියෙන් විස්තර කරන්න.)

4. (i) ''කතෝලික සභා ධර්මෝපදේශය'' අනුව අපගේ ජීවිත කෙරෙහි ඇති වගකීම් **දෙකක්** ලියන්න.

- ජීවිතයට ගරු කිරීම.
- ආත්ම ගැලවීම සඳහා ජීවිතය ආරක්ෂා කිරීම.
- දේව මහිමය උදෙසා ජීවිතය ස්තුති පූර්වකව පිළිගැනීම.

(ii) දෙවියන් වහන්සේ, මනුෂ්‍යයා විසින් පාලනය කරනු ලැබීම සඳහා ඔහු යටතට පත්කළ සතුන් වර්ග **තුනක්** නම් කරන්න.

- මහ මුහුදේ මසුන්, අහසේ පක්ෂීන්, ගවමහීෂයින්, වන මෘගයින්, උරගයින්

(iii) අන් අයගේ ජීවිත සුරැකීමට ඔබ කටයුතු කරන ආකාරය කරුණු **පහකින්** විස්තර කරන්න.

- මිනිසුන්ට ඔවුන්ගේ ම තීරණ ගැනීමට සහ නිදහස් කැමැත්ත අනුව කටයුතු කිරීමට සහය වීම හා දිරිගැන්වීම.
- හානියක් වීමට පෙර එය වළක්වා ගැනීම.
- ඉදිරිපත් කරන ලද අවදානමට සුදුසු ලෙස මුහුණ දීම.
- ආරක්ෂාව සඳහා කටයුතු කිරීම.
- ඔවුන් හා එක්ව සිටීම.
- වගවීම.
- නොමඟ ගිය යහළුවන් නිසි මඟට ගැනීම.
- සමාජයේ අසරණ අයට පිහිට වීම.
- ජාති හෝ ආගම් භේදවලින් තොර ව සැමදෙනාව ම එක සේ පිළිගැනීම.
- සමාජයේ කොන් වී සිටින අය ව ඇසුරට ගෙන ඔවුන් හා එක් ව කටයුතු කිරීම.
- රෝගී අසරණ අයට ඇප උපස්ථාන කිරීම.

(මෙවැනි කරුණු **පහක්** කෙටියෙන් විස්තර කරන්න.)

5. (i) පංච පුස්තකයෙහි සඳහන් පූජක සම්ප්‍රදායට අයත් සිද්ධි **දෙකක්** ලියන්න.

- මැවීම පිළිබඳ පළමු කථාව.
- නෝවා සමග ගිවිසුම.

(ii) පංච පුස්තකයේ ඇති වැදගත්කම කරුණු **තුනකින්** ඉදිරිපත් කරන්න.

- දේව ධාර්මික තේමා රාශියකින් පෝෂණය වී ඇත .
- දෙවියන් වහන්සේට පමණක් වන්දනා කරන ලෙස දක්වයි.
- දෙවියන් වහන්සේගේ ආදරය හා කරුණාව හේතු කොට ගෙන විශ්වයේ ගැලවීම සඳහා තෝරා ගත් ජනතාව ඉශ්රායෙල්වරු බව පෙන්වා දෙයි.
- ඉශ්රායෙල්වරුන් වහල්භාවයෙන් මුදවා පොරොන්දු දේශය කරා ගෙනයාම ආදිපිතෘන්ට දුන් පොරොන්දු ඉටු කිරීම බව පෙන්වා දෙයි.
- දෙවියන් වහන්සේ නීතිය මගින් දුබල මිනිසා හික්ම වන බව පෙන්වා දෙයි.
- දෙවියන් වහන්සේට පක්ෂපාත වීම තුළ දේවාශීර්වාදයට පංගුකාරයන් වන බව පෙන්වා දෙයි.

(iii) දේව වචනය ඔබේ ජීවිතයට ආලෝකයක් කරගන්නා ආකාරය කරුණු **පහකින්** පැහැදිළි කරන්න.

- දවසට නියමිත ශුද්ධ ලියවිලි පාඨ කියවා මෙනෙහි කිරීම තුළින් ජීවිතයට මඟ පෙන්වීමක් ලබා ගත හැකි ය.
- ඔබ කියවූ පාඨය ගැන මෙනෙහි කිරීමට මොහොතක් ගත කරන්න. දේව වචනය තුළින් ඔබට කතා කිරීමට දෙවියන් වහන්සේගෙන් ඉල්ලා සිටින්න. දේව වචනය ඔබේ ජීවිතයේ නිරන්තර පැවැත්මක් බවට පත්කරමින් ඔබේ තීරණ සහ ක්‍රියාවන්ට මඟ පෙන්වන ලෙස යාච්ඤා කරන්න.
- එදිනෙදා ජීවිතයේ දී අපට පැමිණෙන අභියෝගවලට ශක්තිමත්ව මුහුණ දීමට දේව වචනය පිටුබලයක් කර ගැනීම.
- ශුද්ධ ලියවිල්ල ගැඹුරට හදාරන්න. බයිබල් පාඩම් කණ්ඩායමකට සම්බන්ධ වන්න. ඓතිහාසික හා සංස්කෘතික සන්දර්භය අවබෝධ කර ගැනීමෙන් ඔබේ ජීවිතය සඳහා ගැඹුරු අර්ථයක් ගත හැකි ය.
- දෙවියන් වහන්සේගේ වචනය ඔබට ආලෝකයක් වන්නා සේම එය ඔබ තුළින් බැබළෙන්නට සලස්වන්න. අන් අය සමග ශුද්ධ ලියවිල්ල බෙදා ගන්න. දෙවියන් වහන්සේගේ පොරොන්දු අනුව ඔවුන්ව දිරිමත් කරන්න. ඔබේ ජීවිතය තුළ දේව වචනය පිළිබිඹු වන බව අන් අයට පෙනෙන පරිදි ජීවත් වන්න.
- ශුද්ධ ලියවිල්ලේ ඇති පොරොන්දු විශ්වාස කරන්න. මෙමගින් ඔබට සාමය සහ බලාපොරොත්තුව ලබා ගත හැකි ය.
- ආතතිය, සැකය හෝ තීරණ ගැනීමේ අවස්ථාවන්හී දී, ''දෙවියන් වහන්සේගේ වචනය මේ ගැන පවසන්නේ කුමක් ද?'' යි මෙනෙහි කරන්න.

6. (i) ප්‍රසාද ස්නාපනය දානය කිරීමේ දී 'ක්‍රිසම්'(Chrism) තෙලය ආලේප කිරීම මගින් කිතුනුවකු ශක්තිමත් කරනු ලබන්නේ කුමක් සඳහා දැයි කරුණු **දෙකකින්** ලියා දක්වන්න.

- තම විශ්වාසය අනුව ජීවත් වීමට.
- තම විශ්වාසයට විරුද්ධ ව යමක් ඇති වුවහොත් ඊට විරුද්ධ ව සටන් කිරීමට.

(ii) ප්‍රසාද ස්නාපනයෙන් ලැබෙන දේව වරප්‍රසාද **තුනක්** සඳහන් කරන්න.

- ජන්ම හා කර්ම පාපවලට සමාව හා ඒවාට නියමිත දඬුවම්වලට සමාව ලැබීම.
- දේව දරුකම ලැබීම.
- ශුද්ධ වූ ත්‍රිත්වය එම පුද්ගලයා තුළට වැඩම කිරීම.
- ආත්මය තුළ නොමැකෙන ලාංඡනයක් සනිටුහන් වීම.
- දේව රාජ්‍යයේ පංගුකාරත්වය ලැබීම.
- අනෙකුත් දේව ප්‍රසාද නිධාන ලබා ගැනීම සඳහා සුදුස්සෙකු වීම.
- පූජක, එඬේරික හා දිවැසි කාර්යයන්ට හවුල්කරුවන් වීම.
- අතිඉන්ද්‍රිය ක්‍රිස්තු දේහයේ අවයවයන් බවට පත්වීම.
- ශුද්ධ වූ සභාවේ සාමාජිකත්වය ලැබීම.

(මෙවැනි කරුණු **තුනක්** සඳහන් කරන්න.)

(iii) ප්‍රසාද ස්නාපනය තුළින් ඔබ ලැබූ ත්‍රිවිධ කාර්යයන් ක්‍රියාවට නංවන ආකාර **පහක්** පැදැදිළි කරන්න.

- **පූජක කාර්යයේ ජීවත් වීම**
  - පූජක භූමිකාවේ කොටසක් ලෙස, එබට ඔබගේ යාච්ඤා, වැඩ සහ එදිනෙදා ක්‍රියාවන් ආත්මික පූජාවක් ලෙස දෙවියන් වහන්සේට පිරිනැමිය හැක. මෙයට ඔබේ දවස දෙවියන් වහන්සේට කැප කිරීම, අන් අය වෙනුවෙන් හා විශේෂයෙන් අවශ්‍යතා ඇති අය වෙනුවෙන් යාච්ඤා කිරීම ඇතුළත් විය හැකි ය.
  - ශුද්ධවන්තකම සඳහා වෙහෙසීම, දෙවියන් වහන්සේගේ ආඥා පිළිපැදීමට උත්සාහ කිරීම සහ ඔබේ පුණ්‍ය ක්‍රියා හා යාච්ඤා තුළින් අන්‍යයන්ට ඔවුන්ගේ ඇදහිල්ල වර්ධනය කිරීමට උපකාර කළ හැකි ය.
  - මීසමේ කටයුතු සඳහා දායක විය හැකි ය.

- **දිවැසි කාර්යය ජීවත් වීම**
  - දිවැසි කාර්යභාරය වන්නේ දෙවියන් වහන්සේගේ වචනය පැතිරවීමයි. ක්‍රිස්තුන් වහන්සේගේ සහ සභා ඉගැන්වීම් අවිධිමත් ලෙස ඉදිරිපත් නොකර මිතුරන් සහ පවුලේ අය සමග බෙදා ගැනීම හෝ ඉගැන්වීම දේශනා කිරීම ආගමික අධ්‍යාපනයේ යෙදීම වැනි විධිමත් ක්‍රම මඟින් කළ හැකි ය.
  - ලෝකයේ දෙවියන් වහන්සේගේ සත්‍යයට සාක්ෂිකරුවෙකු වීම. මෙයට අයුක්තියට එරෙහිව කතා කිරීම, සාමය ප්‍රවර්ධනය කිරීම සහ සෑම පුද්ගලයෙකුගේ ම ගෞරවය වෙනුවෙන් පෙනී සිටීම ඇතුළත් විය හැකි ය.
  - දෙවියන් වහන්සේ කෙරෙහි පූර්ණ විශ්වාසය තබා දේව වචනයට කීකරු වෙමින් කටයුතු කළ හැකි ය.

- **රාජකීය කාර්යයේ ජීවත් වීම**
  - රාජකීය කාර්යය යනු බලයෙන් පාලනය කිරීම නොව යටහත් පහත්කම, යුක්තිය සහ සේවය සමග නායකත්වය දීමයි. ඔබේ පවුල ප්‍රජාව හෝ සේවා ස්ථානය පිළිබඳ වගකීම සේවක හදවතින් භාර ගනිමින්, පුද්ගලික ලාබ ප්‍රයෝජන නොසොයා, මඟ පෙන්වීම සහ රැකවරණය ලබා දීමෙන් ඔබට මෙම කාර්යභාරය ඉටු කළ හැකි ය.
  - රාජකීය භූමිකාවේ කොටසක් ලෙස ඔබ පොදු යහපත සඳහා වැඩ කිරීමට කැඳවනු ලැබේ. මෙය කළ හැක්කේ සමාජ සාධාරණත්වය වෙනුවෙන් පෙනී සිටීම, ගැටුම් නිරාකරණය කිරීමට උපකාර කිරීම හෝ දේව රාජ්‍යයේ වටිනාකම්වලට අනුකූල වන ප්‍රතිපත්ති ප්‍රවර්ධනය කිරීමෙනි.
  - විවිධ අවස්ථාවල දී තමන්ට පැවරෙන වගකීම් හැකි උපරිමයෙන් ඉටු කිරීම.

  (මෙවැනි කරුණු **පහක්** පැහැදිලි කරන්න.)

7. පහත සඳහන් මාතෘකාවලින් **දෙකක්** තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.

   (i) **දිව්‍ය සත්ප්‍රසාදයීය ලක්ෂණයක් වන 'පරිස්මරණය'**

   - දිව්‍ය සත්ප්‍රසාද භෝජනයට පංගුකාර වන සැම දෙන ක්‍රිස්තුන් වහන්සේ තුළ ජීවත් වෙයි.
   - ක්‍රිස්තුන් වහන්සේ ද ඔවුන් තුළ සදහට ම ජීවත් වෙයි.
   - අපි සැම එක ම ක්‍රිස්තුන් වහන්සේ ව ලබා ගන්නා නිසා අපි එක ම ශරීරයකි.
   - ශුද්ධාත්මික ක්‍රිස්තු දේහය කියනුයේ එයට ය.
   - ශුද්ධ වූ සභාව යනු ශුද්ධාත්මික ක්‍රිස්තු දේහය යි.
   - එම නිසා ක්‍රිස්තුන් වහන්සේ මෙන් අප ද කැඩෙන්නට, බිඳෙන්නට සහ වැය වෙන්නට සූදානම් විය යුතු ය.

   (ii) **ගරු මයිකල් රොද්‍රිගෝ පියතුමා**

   - 1927 දෙහිවල දී උපත ලැබී ය.
   - 1954 ජූලි මස 7 දින පූජකවරය ලැබී ය.
   - මෙතුමා නිර්මල මරිය නිකායට අයත් පියතුමෙකි.

   **සේවාවන්**

   - පූජක දිවිය සේවක පූජකත්වය වෙත ගෙන යාම.
   - ආර්ථික හා සාමාජයීය වශයෙන් දිළිඳු ජනතාවගේ ගැටළුවලට විසඳුම් සෙවීම.
   - තරුණ ප්‍රශ්න වෙනුවෙන් ඉදිරිපත් වීම.
   - බෞද්ධ හා කිතුනු ආගම් අතර සුහදතාව හා සහයෝගීතාව ගොඩ නැගීම.
   - ජනවන්දනාව දේශීයකරණය කිරීම.
   - සාධාරණත්වය මත පදනම් වූ සමජයක් බිහි කිරීම.

   1987 නොවැම්බර් මස 10 දින සහසිකයෙකුගේ වෙඩි පහරින් අප අතරින් සමුගත්තේ ය.

   (මෙවැනි කරුණු **පහක්** ලියන්න.)

(iii) **ඉශ්රායෙල් දිවැසිවරු**

- දෙවියන් වහන්සේ වෙනුවෙන් කථා කළ උන්වහන්සේගේ පණිවුඩය ජනතාවට ප්‍රකාශ කළ පිරිසයි.
- තමන්ට ලැබෙන තත්ත්වය හෝ නිලබලය ගැන නොතකා දේව පණිවුඩය ප්‍රකාශ කළහ.
- දිවැස්වැකි කීමේ දී තුන් ආකාර පද මාලාවක් භාවිත කර ඇත .
- දේශක දිවැසිවරු හා ලේඛක දිවැසිවරු ලෙස කොටස් දෙකකි.
- දිවැසිවරයා හඳුන්වන හීබෲ වදන 'නබී' වේ. ග්‍රීක වචනය 'ප්‍රොෆෙටේස්' වේ.
- දේශක දිවැසිවරුන්ගේ ලක්ෂණ 3 කි.
- ප්‍රධාන දිවැසිවරු හා සුළු දිවැසිවරු ලෙස ද වර්ග කරනු ලැබේ.
- දේශක දිවැසිවරුන් පිළිබඳව සාමුවෙල් හා රාජාවලිය පොත්වල සඳහන් වේ.

(මෙවැනි කරුණු **පහක්** ලියන්න.)

(iv) **කතෝලික අපගේ දහම් පාසල**

- කතෝලික ධර්මය, සක්‍රමේන්තු, සදාචාරය සහ යාච්ඤා ඇතුළු කතෝලික ඇදහිල්ලේ මූලික ඉගැන්වීම් සපයයි.
- බයිබලයේ අර්ථ නිරූපණ සහ යෙදුම් කෙරෙහි අවධානය යොමු කරයි. ශිෂ්‍යයින්ට ශුද්ධ ලියවිලි පාඨ සහ ඒවා කතෝලික සම්ප්‍රදායයන් සහ භාවිතයන්  සමග සම්බන්ධ වන ආකාරය තේරුම් ගැනීමට උපකාර කරයි.
- ප්‍රසාද ස්නාපනය, දිව්‍ය සත්ප්‍රසාදය, තහවුරු කිරීම සහ අනෙකුත් කතෝලිකයන්ගේ ආධ්‍යාත්මික ජීවිතය තුළ ඒවායේ වැදගත්කම, අරමුණ සහ භූමිකාව පැහැදිලි කරමින් සක්‍රමේන්තු හතක් පන්තිය තුළ ආවරණය කරයි.
- ක්‍රිස්තුන් වහන්සේ විසින් මෙලොව ආරම්භ කරන ලද සේවාව දිගින් දිගට ම පවත්වා ගෙන යයි.
- ක්‍රිස්තුන් වහන්සේ සමග ගැඹුරු සබැඳියාවක් ජනිත කරයි.
- සාරධර්ම පිරි ගුණාත්මක අගයයන් හා ආකල්ප වඩන්නට දරු දැරියන් පුහුණු කරයි.
- දස පනත, භාග්‍ය අට සහ සමාජ සාධාරණත්වය, විවාහය සහ මානව ගරුත්වය පිළිබඳ සභා ඉගැන්වීම් වැනි මාතෘකා ඇතුළු ව සදාචාරය පිළිබඳ කතෝලික ඉගැන්වීම් සාකච්ඡා කරයි.
- සිසුන් ප්‍රධාන යාච්ඤාවන් මෙන් ම පුද්ගලික යාච්ඤාවේ වැදගත්කම ද ඉගෙන ගනී.
- පළමු වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීම, සමගි සන්ධානය වැනි සක්‍රමේන්තු ලබා ගැනීමට සූදානම් කරයි.

(මෙවැනි කරුණු **පහක්** ලියන්න.)